අධ්‍යාපනඅමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education**

"ඉසුරුපාය" . ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீயவர்தனபுர, கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", SriJayawardhanapura, Kotte
Battaramulla.

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, **Fax**: 2784846

ඊමේල්. ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk


ඔබේඅංකය / உமது இல / Your No. ....................................

මගේ අංකය / எமது இல / My No. ED /01/44/03/04 (පොදු)

දිනය / திகதி / Date 2016.06.10

චක්‍රලේඛ අංක 19/2016

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නි.අ.අ. / ස.අ.අ.වරුන්,
සියලු ම විදුහල්පතිවරුන් වෙත.

<u>ගුරු වාර්තා පොත</u>

ගුරුවරුන් විසින් සිදු කරනු ලබන කාර්යභාරයන් වාර්තා කිරීම හා ඔවුන් ස්වයං ඇගයීමට පෙලඹවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද ගුරු වාර්තා පොත ක්‍රියාත්මක කිරීමට අදාළව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

මෙම ගුරු වාර්තා පොත හඳුන්වාදීම මගින් පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරේ.

1. ගුරුවරයා ස්වයං ඇගයීමකට යොමු කිරීම.
2. ගුරු ඇගයීම්වල දී (කාර්ය සාධන/ගුරු ප්‍රණාම/උපහාර/සම්මුඛ පරීක්ෂණ/උසස්වීම්.....) සලකා බැලීම.
3. පාසල් කළමනාකරණය පහසු කරවීම.
4. පාසල් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් කාර්යයේ දී තොරතුරු ලබා ගැනීම.
5. ගුරුවරයාගේ පෞද්ගලික දක්ෂතා හා හැකියා වාර්තාගත කිරීම.

මෙම වාර්තා පොත අවුරුදු 10 ක කාලසීමාවක් සඳහා සකසා ඇති අතර, තම සේවා කාලය තුළ දී ගුරු වාර්තා පොත යාවත්කාලීනව පවත්වා ගැනීම සෑම ගුරුවරයෙකුගේ ම වගකීමක් වේ. සෑම ගුරු භවතකු විසින් ම මෙම පොතෙහි ඇතුළත් ආකෘති පත්‍ර අංක 03 වාර්ෂිකව සම්පූර්ණ කළ යුතු ය.

සියලු ම ගුරුවරුන්ට ගුරු වාර්තා පොතක් බැගින් ලබා දීම හා මේ පිළිබඳව දැනුවත් කිරීම සෑම විදුහල්පතිවරයෙකුගේ ම වගකීමක් වේ.

පළාත්, කලාප හා කොට්ඨාස අධ්‍යක්ෂවරුන් විසින් මේ පිළිබඳව විදුහල්පතිවරුන් දැනුවත් කිරීම හා මෙම පොත නිසි පරිදි භාවිත වන්නේදැයි නියාමනය කිරීම සිදු කළ යුතු ය.

යම් හෙයකින් ගුරු වාර්තා පොත අස්ථානගත වුවහොත් විදුහල්පති මගින් වහාම තම පෞද්ගලික ලිපි ගොනුව ඇති කාර්යාලයේ ප්‍රධානියාට දන්වා ඔහුගේ නිර්දේශය මත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතියෙන් නව පිටපතක් ලබා ගැනීම සිදු කළ යුතු ය.

ඩබ්ලිව්.එම්. බන්දුසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්
1. සභාපති, ජාතික අධ්‍යාපන කොමිසම
2. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
3. සියලු ම ශාඛා ප්‍රධානීන් - අධ්‍යාපන අමාත්‍යාංශය